සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவமாகாணக்கல்விதிணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2024
අවසාන වාර පරීක්ෂණය

ව්‍යාපාර අධ්‍යයනය I **Business Studies I**	**32 S I**	13 ශ්‍රේණිය தரம் 13 **Grade 13**

පැය 2 යි
02 மணித்தியாலம்
Two Hours

විභාග අංකය ....

01)
A - මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු කායික හා මානසික තත්වයන්
B –මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන වෙළඳපොළට ඉදිරිපත් කරන ඕනෑම දෙයක්
C – ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් මුණගැහෙන හෝ සම්බන්ධ වන ඕනාම තත්වයක්
D - වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.

ඉහත **A,B,C** හා **D** මඟින් කියැවෙන දෑ අනුපිළිවෙළින් සඳහන් වන කාණ්ඩය තෝරන්න.
1. වුවමනා, භාණ්ඩ, වෙළඳපොළ, වක්‍ර නිෂ්පාදනය
2. අවශ්‍යතා, නිෂ්පාදිත, භාණ්ඩ හුවමාරුව, කර්මාන්ත
3. වුවමනා, භාණ්ඩ, හුවමාරුව, වක්‍ර නිෂ්පාදනය
4. අවශ්‍යතා, නිෂ්පාදිත, වෙළඳපොළ, වක්‍ර නිෂ්පාදන
5. අවශ්‍යතා, නිෂ්පාදිත, විද්‍යුත් ව්‍යාපාර, වෙළඳපොළ අවකාශය

02) තෘතීය ව්‍යාපාර වල යෙදී සිටින පුද්ගලයන් පමණක් අයත්වන වරණය කුමක්ද?

1. ගුරුවරයන්, මාධ්‍යවේදියා, වඩු කාර්මිකයා
2. මාධ්‍යවේදියා, වෛද්‍යවරයා, කොටස් තැරැව්කරු
3. ගොවියා, ඉංජිනේරුවා, වඩු කාර්මිකයා
4. විදුලි කාර්මිකයා, වේටර්වරයා, ඉංජිනේරුවා
5. කොටස් තැරැව්කරු, වඩු කාර්මිකයා, කොන්දොස්තර

03) සාර්ව පරිසර බලවේගයක් වන ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. සේවා නියුක්තිය, පොළී අනුපාතය, පවුලේ සංයුතිය, ජීවන වියදම
2. ආයෝජන, වෙළඳ ගිවිසුම්, ජීවන රටාව,
3. පොලී අනුපාතය, සේවා නියුක්තිය, ආයෝජන ජීවන වියදම
4. ඉතුරුම්, ආදායම් විෂමතාවය, වෙළඳ සම්බාධක, ජීවන රටාව
5. ඉතුරුම්, ආයෝජන, වෙළඳ සම්බාධක, පවුල් සංයුතිය

04) පහත සඳහන් කටයුතු අතරින් පළාත් පාලන ආයතන වලට අදාළ නොවන කටයුත්ත වන්නේ,

1. අපද්‍රව්‍ය වෙන් කිරීම.
2. වෙළඳසැල් ඉදිකර කුළියට දීම.
3. ආදාහනාගාර පවත්වාගෙන යාම.
4. ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
5. හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් දන්වා සිටීම.

05) ශ්‍රී ලංකාවේ ප්‍රමිති ආයතනයට අදාළ කටයුතු කිහිපයක් පහත දැක්වේ.

A - ප්‍රමිතිකරණය සහ තත්ව පාලනය
B – SLS ලාංඡන ක්‍රියාත්මක කිරීම.
C - පූර්ව අපනයන පරීක්ෂාව.
D - උපකරණ ක්‍රමාංකනය
E - ආනයන පරීක්ෂාව
F - පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.
ඉහත දැ අතුරින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාරය ඇතුලත් වරණය තෝරන්න.

1. BCE 2. ABE 3. BDF
4. ADE 5. BCD

06) හවුල් ඔප්පුවක් පැවතීමෙන් හවුල් ව්‍යාපාරයකට අත්වන ප්‍රධාන වාසිය කවරේද?

1. හවුල්කරුවන් අතර ලාභ අලාභ සම සමව බෙදා ගනියි.
2. එක් එක් හවුල් දායක විය යුතු ආකාරය සඳහන් කර තිබීම.
3. හවුල්කරුවන් අතර මතභේද ඇතිවීමට තිබෙන ඉඩ කඩ අවම වීම.
4. ලාභ අලාභ බෙදා ගැනීම සම්බන්ධ හවුල් කරුවන් අතර ගැටළු ඇති නොවීම.
5. හවුල් කරුවන්ගේ අයිතිවාසිකම් දක්වා තිබීම.

07) රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය දෙපාර්තමේන්තු අතර ලක්ෂණ පහත දැක්වේ.

A - රජයේ වාර්ෂික අය වැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කිරීම.
B - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
C - විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම.
D - පූර්ණ අයිතිය හෝ වැඩි අයිතිය රජය සතු වීම.
E - අමාත්‍යාංශයක් යටතේ සෘජු පාලනයට යටත් වීම.

ඉහත ලක්ෂණ අතුරින් රාජ්‍ය සංස්ථා වලට අදාළ ඒවා පමණක් ඇතුලත් වරණය වන්නේ,

1. A හා C 2. D හා E 3. B හා C 4. C හා D 5. A හා D

08) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පිළිවෙළින් දැක්වෙන්නේ,

1. නව්‍යතා සොයාගැනීම, සංකල්ප ගොඩනැගීම හා සැලසුම් සැකසීම යථාර්තයක් බවට පත්කර ගැනීම.
2. නව්‍යතා සොයා ගැනීම, යථාර්තයක් බවට පත් කර ගැනීම, අවශ්‍යතා සම්පත් සොයා ගැනීම, ප්‍රතිලාභ ගැනීම, සංකල්ප ගොඩ නැගීම.
3. සංකල්ප ගොඩ නැගීම, සම්පත් සම්පාදනය, නව්‍යතා සොයාගැනීම, ප්‍රතිලාභ ලැබීම, යථාර්තයක් බවට පත් කිරීම.
4. නව්‍යතා සොයාගැනීම, සංකල්ප ගොඩ නැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම, අවශ්‍ය සම්පත් සම්පාදනය, යථාර්තයක් බවට පත්කිරීම, ප්‍රතිලාභ ලැබීම.
5. නව්‍යතා සම්පාදනය කිරීමට පසුබිම සැකසීම, වර්ධනය හා ප්‍රතිලාභ ලැබීම.

09) ව්‍යාපාරයක් විසින් ලබා ගෙන ඇති රක්ෂණාවරනයක් හා එහි රක්ෂණාවරනය මගින් ආවරණය වන විෂය වස්තුව පහත වගුවේ දැක්වේ.

රක්ෂණාවරනය	විෂය වස්තුව
1 - මාර්ගස්ථ භාණ්ඩ	A නිපදවන භාණ්ඩ
2 - ගිනි උවදුරු රක්ෂණය	B වෑන් රථය
3 - සේවා යෝජක වගකීම	C ප්‍රවාහන භාණ්ඩ
4 - නිෂ්පාදන වගකීම	D සේවාදායකයන්

රක්ෂණාවරණය හා රක්ෂිත විෂයය වස්තුව නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

1. **1 – C, 2 – B, 3 – D, 4 – A**
2. **1 – C, 2 – D, 3 – B, 4 – A**
3. **1 – D, 2 – C, 3 – A, 4 – B**
4. **1 – B, 2 – D, 3 – C, 4 – A**
5. **1 – A, 2 – C, 3 – D, 4 – B**

10) බලපත්‍රලාභී මුදල් සමාගම් වල කාර්යයක් නොවන්නේ,

1. කෙටි කාලීන ණය සැපයීම.
2. රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීම.
3. කුළී පිට ගැනුම් පහසුකම් සැපයීම.
4. දේපල හා ඉඩම් වෙළඳාම් කිරීම.
5. අයිරා පහසුකම් සැලසීම.

11) හානියක් සඳහා රක්ෂණ ආයතනයකින් වන්දි ලැබුණු පසු එම හානියට බාහිර පාර්ශවයකින් වන්දි ලබා ගැනීමට රක්ෂිතයාට ඇති අයිතිය රක්ෂකයාට පැවරීමට අදාල මූලධර්මය,

1. රක්ෂණ හිමිකම
2. උපරිම විශ්වාසය
3. දායකත්වය
4. ආදේශනය
5. ආසන්නතම හේතුව

12) ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහනයට සාපේක්ෂව දුම්රිය ප්‍රවාහනයේ ඇති ප්‍රධාන අවාසි බැඳී පවතිනුයේ,

1. වේගය සමගය.
2. පිරිවැය සමගය.
3. සුලභත්වය සමගය.
4. ආරක්ෂාව සමගය
5. ධාරිතාව සමගය

13) සන්නිවේදන් මූලිකාංග කිහිපයක් **X** තීරුවේද, එම මූලිකාංග පිළිබඳව පැහැදිලි කිරීම **Y** තීරුවේද දැක්වේ.

X	Y
A ආකේතනය	**(1)** පණිවුඩය මාධ්‍ය හරහා ලබාගැනීමේ ක්‍රියාවලියයි.
B ප්‍රතිපෝෂණය	**(2)** පණිවුඩය ලැබුණු පසු ලබන්නා දක්වන ප්‍රතික්‍රියාවයි.
C විකේතනය	**(3)** ලබන්නාගෙන් යවන්නා වෙත ලැබෙන පිළිතුරයි.
D ප්‍රතිචාරය	**(4)** පණිවුඩය මාධ්‍යට ඇතුළු කිරීමේ ක්‍රියාවලියයි.

ඉහත **X** හා **Y** තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිත්‍රු වනුයේ,

1. **A – 4, B – 2, C – 1, D – 3**
2. **A – 1, B – 3, C – 4, D – 2**
3. **A – 4, B – 1, C – 2, D – 3**
4. **A – 4, B – 3, C – 1, D - 2**
5. **A – 2, B – 1, C – 4, D – 3**

14) සංවිධානයක අරමුණු අපේක්ෂිත ආකාරයෙන්ම ඉටු කර ගැනිම හඳුන්වනු ලබන්නේ,

1. කාර්යක්ෂමතාව ලෙසය
2. කළමනාකරණය ලෙසය.
3. සඵලදායකත්වය ලෙසය.
4. ඵලදායකතවය ලෙසය.
5. සැළසුම්කරණය ලෙසය.

15) පහත වගුවේ **X** තීරුවේ කළමනාකරණ කාර්යයන් දැක්වෙන අතර ඒවාට අදාළ ක්‍රියාකාරකම් **Y** තීරුවේ දැක්වේ.

X	Y
A.සැළසුම්කරණය	**1.** විචලතා හඳුනාගැනීම හා ප්‍රතිකර්ම යෙදීම.
B.සංවිධානකරණය	**2.** නායකත්වය හා අභිප්‍රේරණය.
C.මෙහෙයවීම	**3.** කම්ටු පත් කිරීම හා වගකීම් පැවරීම.
D.පාලනය	**4.** අරමුණු හා උපායමාර්ග තීරණය කිරීම.

X හා **Y** තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

1. A – 4, B – 3, C – 2, D – 1
2. A – 3, B – 4, C – 2, D – 1
3. A – 1, B – 2, C – 3, D – 4
4. A – 4, B – 3, C – 1, D – 2
5. A – 2, B – 3, C – 1, D – 2

16) ආයතනයක අග්‍ර කළමනාකරුවන් හා මධ්‍යම කළමනාකරුවන් සතුව තිබිය යුතු කුසලතා සන්සන්දනය පිළිබඳ වූ පහත ප්‍රකාශන අතුරෙන් යෝග්‍යතම ප්‍රකාශය තෝරන්න.

1. අග්‍ර කළමනාකරුවන්ට මධ්‍යම කළමනාකරුවන්ට වඩා සංකල්පමය කුසලතාවන් තිබිය යුතු අතර තාක්ෂණික කුසලතාවන් තිබිය යුත්තේ මධ්‍යම කළමනාකරුවන්ටය.
2. මධ්‍යම කළමනාකරුවන්ට අග්‍ර කළමනාකරුවන්ට වඩා සංකල්පමය කුසලතා හා තාක්ෂණික කුසලතා තිබිය යුතුය.
3. අග්‍ර කලමනාකරුවන්ට මධ්‍යම කළමනාකරුවන්ට වඩා තාක්ෂණික කුසලතා හා අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතුය.
4. අග්‍ර කළමනාකරුවන්ට මධ්‍යම කළමනාකරුවන්ට වඩා වැඩියෙන් අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතු අතර සංකල්පමය කුසලතා වඩා වැඩියෙන් තිබිය යුත්තේ මධ්‍යම කළමනාකරුවන්ටය.
5. අග්‍ර කළමනාකරුවන්ට හා මධ්‍යම කළමනාකරුවන්ට කුසලතා හා තාක්ෂණික කුසලතා සම සමව තිබිය යුතුය.

17) මෙහෙයුම් ක්‍රියාවලියේදී නිෂ්පාදිත නිර්මාණ ක්‍රියාවලිය පරිගණක වැඩසටහන් යොදා ගනිමින් සිදු කිරීම හඳුන්වනු ලබන්නේ,

1. CAM ලෙසය.
2. CNC ලෙසය.
3. CIM ලෙසය.
4. Robotics ලෙසය.
5. CAD ලෙසය.

18) ව්‍යාපාරයක ගබඩා කර ඇති එක්තරා ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

අවම ද්‍රව්‍ය භාවිතය	- දිනකට ඒකක 100
උපරිම ද්‍රව්‍ය භාවිතය	- දිනකට ඒකක 150
ඇණවුම් කාලය	- අවම දින 10
ඇණවුම් කාලය	- උපරිම දින 20
ආර්ථික ඇණවුම් ප්‍රමාණය	- ඒකක 6000

මෙම අයිතමයට අදාළ උපරිම තොග මට්ටම කුමක්ද?

1. ඒකක 8000
2. ඒකක 6000
3. ඒකක 7000
4. ඒකක 9000
5. ඒකක 10,000

19) උසස් ගුණත්වයෙන් යුක්ත භාණ්ඩ සඳහා සාධාරණ අඩු මිලක් නියම කිරීම,

1. පිරිවැයට ලාභාන්තිකයක් එකතු කළ මිල කිරීමයි.
2. ඉලක්ක ඉපයුම් මෙල කිරීමයි.
3. සංජානනීය වටිනාකම් මිල කිරීමයි.
4. වටිනාකම් මිල කිරීමයි.
5. පවත්නා මිල මත මිල කිරීමයි.

20) පහත ක්‍රම අතුරෙන් තොග පාලන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ක්‍රමයකි.

1. ABC විශ්ලේෂණ ක්‍රමය.
2. ද්විත්ව භාණ්ඩ ක්‍රමය.
3. අඛණ්ඩ තොග වාර්තා ක්‍රමය.
4. JIT ක්‍රමය
5. පරිගණක ආශ්‍රිත ක්‍රමය

21) පාරිභෝගිකයන්ගෙන්ම ආරම්භ වී පාරිභෝගිකයන්ගෙන්ම අවසන් වන කාර්යයක් වන්නේ,

1. මූල්‍යකරණය
2. මානව සම්පත් කළනමාකරණය.
3. අලෙවිකරණය
4. පර්යේෂණ හා සංවර්ධනය.
5. නිෂ්පාදන කළමනාකරණය.

22) 'තරඟකාරිත්වයේ මට්ටම් කිහිපයකි' එවැනි මට්ටමකට අයත් නොවන මට්ටම තෝරන්න.

1. සන්නම් තරඟකාරිත්වය
2. ආදේශන තරඟකාරිත්වය
3. ස්වරූප තරඟකාරිත්වය
4. පොදු තරඟකාරිත්වය
5. කර්මාන්ත තරඟකාරිත්වය

23) මූල්‍ය කළමනාකරුගේ අරමුණක් ලෙස සැලකිය නොහැකි අරමුණකි.

1. ලාභය උපරිම කිරීම.
2. අයිතිකරුගේ ධනය උපරිම කිරීම.
3. දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම.
4. භාණ්ඩ වල ගුණත්වය ඉහළ නැංවීම.
5. ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම.

24) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති තුළ ක්‍රියාත්මක මූල්‍ය ආයතන වර්ග කිහිපයක් පහත දැක්වේ.

A - රක්ෂණ සමාගම්
B - කොටස් තැරැව්කාර සමාගම්
C - සේවක අර්ථසාධක අරමුදල
D - ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්
E - සමූපාකාර ග්‍රාමීය බැංකුව

ඉහත මූල්‍ය ආයතන වර්ග අතර ඇති විශේෂිත මූල්‍ය ආයතන ලෙස සැලකිය හැක්කේ.

1. AB හා D
2. A හා C
3. AC හා E
4. B හා D
5. D හා E

25) පහත දැක්වෙන්නේ මූල්‍ය අනුපාත කිහිපයක් ගණනය කරන ආකාරයන් ය. ඉන් නිවැරදි ලෙස ගණනය කර නොමැති මූල්‍ය අනුපාතය කුමක්ද?

1. ක්ෂණික අනුපාතය = ද්‍රවශීල වත්කම් / ජංගම වත්කම්
2. තොග පිරිවැටුම් අනුපාතය = විකුණුම් පිරිවැය / සාමාන්‍ය තොගය
3. ණය අනුපාතය = ණය ගැතියෝ / මුළු ප්‍රාග්ධනය × 100
4. දළ ලාභ අනුපාතය = දළ ලාභය / විකුණුම් × 100
5. ණය හිමිකාරිත්ව අනුපාතය =

26) පහත දැක්වෙන්නේ අහලුම් කම්හලක කළමනාකරුවෙකු විසින් එහි සේවකයන් අමතා කළ කථාවකින් උපුටා ගත් කොටසකි.

"ලබන ජනවාරියේ සිට ඔබේ අවම වැටුප රු. 30,000 දක්වා වැඩි කරන අතර අතිකාල දීමනා ඉහළ නංවනවා. ඊට අමතරව වසර පහකට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයට සුදුසුකම් අනුව උසස්වීම් ලබා දීමටත් වාර්ෂික විනෝද චාරිකාව යලි සංවිධානය කිරීමටත් විශේෂ ණය පහසුකම් කිහිපයක් හඳුන්වා දීමටත් අප්‍රේල් වලට අමතරව දෙසැම්බර් වලද ප්‍රසාද දීමනා ලබා දීමටත් තීරණය කර තිබෙනවා. ඒ වගේම අපේ නිෂ්පාදනාගාරය වායු සමනය කිරීමටත් සැලසුම් කර තිබෙනවා.

මෙහි සඳහන් වන මූල්‍ය නොවන අභිප්‍රේරන ගණන කොපමණද?

1. 1කි. 2. 2 කි. 3. 3 කි. 4. 4 කි. 5. 6 කි.

27) පහත වගුවේ මානව සම්පත් කළමනාකරනයට අයත් කාර්යයන් හා ඒවාට අදාල කටයුතු කිහිපයක් දක්වා ඇත.

මානව සම්පත් කළමනාකරන කාර්යය	අදාළ කටයුතු
i.	A අයදුම්පත්
ii. සේවක දුක්ගැනවිලි නිරාකරණය	B රැකියා අපේක්ෂා කරන්නන් ලැයිස්තුවක නිර්මාණය කිරීම.
iii. රැකියා විග්‍රහය	C උපදේශනය
iv. තෝරා ගැනීම	D රැකියා පරිසරයට සේවකයො හඳුන්වා දීම
v. අනුස්ථාපනය	E රැකියා විස්තරය පිළියෙල කිරීම.

ඉහත දී ඇති මානව සම්පත් කළමනාකරන කාර්යය අනුපිළිවෙල අනුව ඒවාට අයත් කටයුතු නිවැරදි ව ගලපා ඇති වරණය කුමක්ද?

1. E, B, A, C, D
2. B, A, E, D, C
3. A, C, E, B, D
4. B, C, E, A, D
5. A, C, B, D, E

28) පහත දැක්වෙන්නේ භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග කිහිපයකි.

A - දැනුම් කාර්ය පද්ධති
B - තීරණ උපකාරක පද්ධති
C - ගනුදෙනු සැපයුම් පද්ධති
D - විධායක උපකාරක පද්ධති
E - කළමනාකරන තොරතුරු පද්ධති

ඉහත දැ අතරින් දැනුම මට්ටමේ දී සහ කළමනාකරන මට්ටමේදී භාවිතා කරන තොරතුරු පද්ධති වර්ග පිළිවෙලින් ඇතුලත් වරණය කුමක්ද?

1. AC සහ DE
2. AF සහ BE
3. AF සහ BD
4. BC සහ AD
5. BF සහ DE

29) ආයතනයේ ශ්‍රිත අනුව තොරතුරු වර්ගීකරණය කෙරේ. එම වර්ගීකරණය වන්නේ,

1. උපක්‍රමික තොරතුරු / උපායශීලී තොරතුරු / ක්‍රියාකාරී තොරතුරු
2. මූල්‍ය තොරතුරු / නිෂ්පාදන තොරතුරු / අලෙවිකරණ තොරතුරු / මානව සම්පත් තොරතුරු
3. සැලසුම්කරන තොරතුරු / ක්‍රියාකාරී තොරතුරු / පාලනයකරන තොරතුරු
4. ආර්ථික තොරතුරු / වර්තමාන තොරතුරු / ආනයන තොරතුරු
5. ගුණාත්මක තොරතුරු / ප්‍රමානාත්මක තොරතුරු

30) **ව්‍යාපාර සැලස්මක් සකස්කර ගැනීමට සහය ලබා ගැනීමට හැකි ආයතනයක් වන්නේ,**

1. **රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව.**
2. **කුඩා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය.**
3. **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.**
4. **ජාතික මෝස්තර මධ්‍යස්ථානය.**
5. **මධ්‍යම පරිසර අධිකාරිය.**

★ **සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. ගනුදෙනු අඛණ්ඩව සිදුවීම ව්‍යාපාර .... වන අතර මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම ප්‍රධාන ව්‍යාපාර .... වේ.

32. ව්‍යාපාරයේ .... පැවැත්ම තහවුරු වීමත් ව්‍යාපාරය පිළිබඳ .... තහවුරු වීමත් සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභය.

33. වරලත් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී .... සහ .... අතර වරලත් ගිවිසුමක් ඇතිකර ගත යුතුය.

34. රටපුරා ව්‍යාප්තව පැවති .... ප්‍රවාහන ක්‍රමයේ වාසියක් වන අතර .... එම ප්‍රවාහන ක්‍රමයට අදාල පර්යන්තයකි.

35. ජාත්‍යන්තර ලිහිල් කිරීම යන සුපරීක්ෂණය සඳහා .... ආරම්භ කරන ලද්දේ .... වර්සයේදීය.

36. වාණිජ බැංකු හා ප්‍රාථමික වෙළඳුන් තම අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතිකය .... වේ. එය රටේ .... පාලනය සඳහා යොදාගත හැකිය.

37. ව්‍යවසායකත්වය කෙරෙහි බලපෑම් කරන සමාජ විද්‍යාත්මක සාධක දෙකක් ලෙස................................. හා .... පෙන්වා දිය හැකිය.

38. මෙහෙයුම් කළමණාකරණය නිසා මෙහෙයුම් ක්‍රියාවලියේ .... හා .... වැඩිකරගත හැකිය.

39. කළමණාකරණය යනු .... ව්‍යාපාර පරිසරය තුල .... ප්‍රකාශිත පරමාර්ථ හා අරමුණු .... ඉටුකර ගැනීම සඳහා සංවිධානය සතු සම්පත් සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය ඇතුලත් ඵලදායී ක්‍රියාවලියකි.

40. තොගයෙහි ඇතිවන වෙනස්කම් එලෙසින්ම වාර්තා කරන කවර අවස්ථාවක වුවද ගබඩාවේ තිබෙන ශේෂය දැක ගත හැකි ආකාරයට තොග වාර්තා කිරීම .... ක්‍රමය ලෙසද තොග පාලනය සඳහා නිපදවා ඇති පරිගණක මෘදුකාංග භාවිතා කිරීම .... ක්‍රමය ලෙසද හඳුන්වයි.

41 කාර්මික විප්ලවය හේතුවෙන් වාණිජ ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් 4 ක් දක්වන්න.

....

....

....

....

42. ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පොදුවේ සමාජයට බලපෑම් ඇතිකරනා බලවේග මොනවාද?

....

....

....

....

43. ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ මොනවාද?

....

....

....

....

44 ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන 4 ක් දක්වන්න.

....

....

....

....

45. ව්‍යාපාරයක් භාවිතා කරණ ප්‍රවාහන සැපයුම් සේවා පද්ධති හතරක් දක්වන්න.

....

....

....

....

46. ව්‍යාපාර අපේක්ෂණ හතරක් දක්වන්න.

....

....

....

....

47. ශ්‍රම ඵලදායිතාව වර්ධනය කරගත හැකි ආකාර හතරක් දක්වන්න.

....

....

....

....

48. පිලිප් කොට්ලගේ පාරිභෝගික වටිනාකමේ ධූරාවලියේ මට්ටම් 4 ක් දක්වන්න.

....

....

....

....

49. ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොලේ කාර්ය සාධකය මැනීම සඳහා භාවිතා කරන මිල දර්ශක දෙකක් දක්වන්න.

....

....

....

....

50. යෝජිත අලෙවි උපායමාර්ග සඳහා ඇතුලත් විය යුතු තොරතුරු හතරක් දක්වන්න.

....

....

....

....

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவமாகாணக்கல்வித்திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2024
අවසාන වාර පරීක්ෂණය

ව්‍යාපාර අධ්‍යයනය II **Business Studies II**	**32** **S** **II**	13 ශ්‍රේණිය தரம் 13 **Grade 13**
පැය 3 යි 03 மணித்தியாலம் **Three Hours**		අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි மேலதிவாசிப்புநேரம் - 10 நிமிடங்கள் **Additional Reading Time - 10 minutes**

■ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්ණ දෙකක් බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

01. සී/ස ආසිරි සමාගම දේශීය අමුද්‍රව්‍ය බහුලව භාවිතා කොට නැවුම් දියර කිරි අයිස් ක්‍රීම් යෝගට් නිපදවා බෙදා හරී. විශාල දක්ෂ පළපුරුදු සේවක සංඛ්‍යාවක් සේවයේ නිරත වන අතර එක් එක් අය වෙන් වෙන් වූ කාර්යාලවල නිරත වේ. පිරිවැය ඉහළ යාම, විදේශ නිෂ්පාදන සමග තරගය ඉහළ යාම, ප්‍රබල අභියෝග වන අතර අපද්‍රව්‍ය බැහැර කිරීම ද ගැටළුවක් වේ. දේශීය අමුද්‍රව්‍ය බහුලව භාවිතා කිරීමෙන් විදේශ විනිමය ඉතිරි කිරීමට රටේ සංවර්ධනයටද එය දායක වේ. සමාජ වගකීම් ඉටු කිරීම කෙරෙහිද සමාගම අවදානය යොමු කරයි.

i. අ) ආසිරි සමාගම ඉටු කරන අවශ්‍යතාවය හා වුවමනාව ලියන්න.
ආ) ආසිරි සමාගම ව්‍යාපාරයක් ලෙස හැඳින්වීමට කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

ii. අ) ආර්ථිකයේ පැවැත්මට ඉහත සමාගම දායක වන ආකාරය කරුණු හතරකින් ඉදිරිපත් කරන්න.
ආ) සේවකයින් වෙන් වෙන් වූ කාර්යන්වල නිරත වී කුමන නමකින් හැඳින්වේද?

iii. අ) ආසිරි සමාගමේ ව්‍යාපාර කාර්යයන් හතරක් උදාහර සහිතව පැහැදිලි කරන්න.

iv. අ) ඉහත සමාගමේ සේවකයින් ව්‍යාපාරය කෙරෙහි උනන්දු වීමට හේතු දෙකක් දක්වන්න.
ආ) ආසිරි සමාගමට අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

v. අ) සමාජීය වගකීම් ඉටු කිරීමෙන් ආසිරි සමාගමට ලබා ගත හැකි ප්‍රතිලාභ මොනවාද?
ආ) පාරිසරික තිරසර සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා සමාගම අවදානය යොමු කළ යුතු කරුණු මොනවාද?

02. ව්‍යාපාර සමාජ වගකීම් නිවැරදිව ඉටුවීමට නම් ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදිය යුතු බව විෂන් සමාගමේ ප්‍රධාන විධායක නිළධාරිතුමා පවසයි.

i. අ) ව්‍යාපාර ආචාරධර්ම අනුගමනය කළ හැකි විවිධ ක්ෂේත්‍ර මොනවාද?
ආ) ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

ii. රජය ව්‍යාපාර කටයුතු කෙරෙහි විවිධ අන්දමින් මැදිහත් වේ.
අ) රජය ව්‍යාපාර කටයුතු සඳහා මැදිහත් වීමේ අරමුනු හතරක් දක්වන්න.
ආ) රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහය හා මඟපෙන්වීම වැදගත්වන ආකාර දෙකක් දක්වන්න.

iii. මෑත කාලීනව බී ලූණු මිල සීග්‍රයෙන් ඉහළ යාම ආර්තිකයේ බොහෝ අංශවලට සෘජුවම බලපෑවේ ය.

අ) ආනයනික බීලූණු මත බදු පැනවීම දේශීය ව්‍යාපාරවලට බලපාන ආකාරය දක්වන්න.

ආ) රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී එය ව්‍යාපාරවලට බලපාන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

iv. පාසල් අධ්‍යාපනයෙන් පසු ඇගලුම් පාඨමාලාවක් හැදෑරීමෙන් පසු සඳුනි රැකියාවක් ලැබෙන තෙක් ඇගළුම් කර්මාන්ත ශාලාවකින් ඉවත ලන ඩෙනිම් රෙදි කැබලි ආශ්‍රයෙන් විසිතුරු තොප්පි මැදීමේ ව්‍යාපාරයක් ආරම්භ කළාය.

අ) සඳුනි ආරම්භ කළ ව්‍යාපාරයේ අවාසි දෙක බැගින් ලියන්න.

ආ) පසුව මෙම ව්‍යාපාරය සීමා සහිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමට තීරණය කළාය. එයින් ව්‍යාපාරයට අත්වන වාසි අවසි දෙක බැගින් ලියන්න.

v. අ) සීමා සහිත පොදු සමාගමක් ආර්ථික සංවර්ධනයට ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

ආ) වරලත් ව්‍යාපාරවල ලක්ෂණ 2 ක් දක්වන්න.

03. වෙන් වෙන්ව කටයුතු කරගෙන යන පෞද්ගලික අංශයේ මූල්‍ය සමාගම් දෙකක් ඒකාබන්ධව කටයුතු කිරීමට ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි.

i. අ) ස්වාධීනව වෙන් වෙන්ව පැවතෙන ව්‍යාපාර ඒකාබන්ධ වී කටයුතු කිරීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

ආ) ව්‍යාපාර සංයෝජනය වන ප්‍රධාන ආකාර දෙක දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. අ) ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

ආ) සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කර ටික දවසකින් වසා දමයි. එසේ එම ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු හතරක් දක්වන්න.

iv. අ) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගමක කාර්යයන් හතරක් සඳහන් කරන්න.

ආ) ස්වයංක්‍රීය බැංකු සේවා මගින් ගනුදෙනුකරුවෙකුට අත්වන වාසි හතරක් දක්වන්න.

v. අ) චෙක්පත් රේඛනයේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

ආ) විද්‍යුත් මුදලින් ගනුදෙනු පියවීමේ දී සංවර්ධන පාර්ශව සඳහන් කරන්න.

04. i. අ) සහන් රක්ෂණ ඔප්පුව ලබා ගන්නා විට සිය රෝගී තත්වය වසන් කර ඇත. ඔහු වන්දි ලබා ගැනීමට යාමේ දී රක්ෂණ ආයතනය වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදි. රක්ෂණ මූලධර්ම මගින් පැහැදිලි කරන්න.

ආ) වගකීම් රක්ෂණය යටතේ ලබා ගත හැකි වගකීම් ඔප්පු වර්ග හතරක් සඳහන් කරන්න.

ii. අ) සඵලදායී සන්නිවේදනයට ඇති බාධා හතරක් සඳහන් කරන්න.

ආ) එම බාධා පිටු දැකීමට භාවිත කළ හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

iii. අ) ප්‍රවාහනය ව්‍යාපාරිකයාට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

ආ) වර්තමානය වන විට බොහෝ නිෂ්පාදන ආයතන විසින් ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් පවත්වාගෙන යාම සුලබව දැකිය හැකිය. සරලව නිෂ්පාදන අයතනයක් විසින් ප්‍රවාහන හා සැපයුම් සේවාවක් පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

iv. අ) වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදාගැනීමේ වාසි මොනවාද?

ආ) සිල්ලර වෙළෙඳාම සඳහා නව තාක්ෂණය භාවිතා කරන ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

v. අ) රටක් විදේශ වෙළඳාමේ නිරතවීමෙන් ලැබෙන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

ආ) විදේශ වෙළඳාමේ ප්‍රවනතා මොනවාද?

II කොටස

05. i. අ) "පුද්ගල හා වසංවිධානවල අරමුණු ඉටුකර ගැනීමට කළමණාකාරණය අවශ්‍ය වේ" උදාහරණ සපයමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

ආ) " ඕනෑම සංවිධානයක් සාර්ථක කර ගැනීමට මනා කළමණාකරණය ඉතා වැදගත් වේ" ආයතනයකට කළමනාකරණය වැදගත් වන්නේ ඇයි.

ii. " කළමණාකරුවෙකු විවිධ භූමිකා රඟ දක්වයි"

අ) හෙන්රි මින්ස්ට් බර්ග්ට අනුව කළමණාකරුවෙකුගේ තීරණ භූමිකා මොනවාදැයි දක්වන්න.

ආ) අග්‍ර කළමණාකරුවන්ට වැදගත් වන්නේ සංකල්පනාත්මක කුසලතා පමණි. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේද ? පැහැදිලි කරන්න.

iii. "බලය අධිකාරියට වඩා වැඩි දෙයකි. "

අ) බලය හා අධිකාරිය අතර වෙනස පැහැදිලි කරන්න.

ආ) කළමණාකාරුවෙකුට බලය ලැබෙන මූලාශ්‍ර දක්වන්න.

iv. "සාර්ථක මෙහෙයුම් ක්‍රියාවලියක මෙහෙයුම් කළමණාකරණය අත්‍යාවශ්‍ය වේ" එම නිසා සම්පත්වලට නව අගයක් එකතු වේ.

අ) මෙහෙයුම් කළමණාකාරණය යනු කුමක්ද?

ආ) සම්පත්වලට අගය එකතු කිරීම හෙවත් එකතු කළ අගය යන්න හඳුන්වන්න.

v. භාණ්ඩයක ගුණත්වය ආරක්සා කිරීඹට තත්ව පාලනය වැදගත් වේ.

අ) ව්‍යාපාරයකට ගුණත්ව පාලනය වැදගත් වීමට හේතු 2 ක් දක්වන්න.

ආ) මෙහෙයුම් කළමණාකරණ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කරගත හැකි නිෂ්පාදන ශිල්පක්‍රම 2 ක් දක්වන්න.

06. i. අ) ව්‍යාපාරයක් විසින් භාවිතාකරනු ලබන පිරියත සැලසුම් වර්ග නම් කරන්න.

ආ) ව්‍යාපාරයකට තොග පාලනය අවශ්‍ය වන්නේ ඇයි.

ii. නිෂ්පාදන ආයතනයක එක්තරා නිෂ්පාදන ධාරිතාව මසකට ඒකක 1000 කි. එම නිෂ්පාදිතයට අදාල අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

ඒකකයක විකුණුම් මිල	රු. 10
ඒකකයක විචල්‍ය පිරිවැය	රු. 5
ස්ථාවර පිරිවැය	රු. 5000
ආර්තික නිෂ්පාදන ඒකක සංඛ්‍යාව	රු. 800

අ) සමච්ඡේදක ලක්ෂයේ ඒකක සංඛ්‍යාව ගණනය කරන්න.
ආ) ඒකකයක දායකය ගණනය කරන්න.

iii. රවිඳු ව්‍යාපාරයේ තොග සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

අවම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 40
උපරිම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 60
යලි ඇනවුම් කාලය - අවම දින 10
උපරිම දින 15
යලි ඇනවුම් ප්‍රමාණය - ඒකක 3000

පහත දෑ ගණනය කරන්න.

1. යලි ඇනවුම් මට්ටම
2. අවම තොග මට්ටම
3. උපරිම තොග මට්ටම
4. සාමාන්‍ය තොගය

iv. මහා පරිමාන නිෂ්පාදන ආයතන වල මෙහෙයුම් කළමණාකරණ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව කිරීමට යොදා ගැනෙන නව නිෂ්පාදන ක්‍රම 4 ක් නම් කර ඉන් 2 ක් පැහැදිලි කරන්න.

v. පහත දෑ නිර්වචනය කරන්න.

- ඉලක්ක වෙළඳපොළ
- පිහිටුවීම

07. පොත් අලෙවිසැලක් පවත්වාගෙන ගිය නෙහාරා, ඇය ගණුදෙනුකල බැංකුවට පවසා තිබුනේ ඇගේ ව්‍යාපාර කටයුතු ඇණ හිටීමට හේතුව රටේ පවතින දේශපාලන අස්ථාවර බව හේතුවෙන් ව්‍යාපාරයට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනය නොහැකි වීම හේතුවයි.

i. අ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපාන සාධක 4 ක් නම්කරන්න.
ආ) නෙහාරාට කාරක ප්‍රාග්ධනය වැඩිකර ගත හැකි ක්‍රම 4 ක් ලියන්න.

ii. අ) රටේ දේශපාලන අස්ථාවර භාවය හැරුණුවිට රටක කොටස් වෙළඳපල පහත වැටීමට හේතුවන සාධක 4ක් ලියන්න.
ආ) කොටස් වෙළඳපලේ අලෙවිවන සුරැකුම්පත් 4 ක් ලියන්න.

iii. දුක් ගැනවිලි කාර්මික ආරවුල්වල මුල් අදියර ලෙස සැලකේ
අ) සේවක දුක් ගැනිවිලි යනු කුමක්ද?
ආ) දුක් ගැනිවිලි නිරාකරණය නිසිලෙස සිදු කිරීමෙන් ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ 4 ක් ලියන්න.

iv. තම වෘත්තීය අයිතිවාසිකම් දිනාගැනීම සඳහා සේවක වෘත්තීය සමිති උපයෝගී කරගන්නා ක්‍රියාමාර්ග 4 ක් ලියන්න.

v. අ) දත්ත සේවකයන් යනු කවුරුන්ද ?
උදාහරණ සපයන්න
ආ) කළමණාකරණ මට්ටම් අනුව තොරතුරු පද්ධති වර්ග කර දක්වන්න.

08. i. වර්තමාන ව්‍යාපාර ප්‍රවණතාවක් වන්නේ කාර්මික ආරවුල් වලින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීමට උත්සාහ කිරීමයි.
අ) කාර්මික ආරවුල් යනු මොනවාද?
ආ) කාර්මික ආරවුල් නිසා පාරිභෝගිකයාට අත්වන බලපෑම් දක්වන්න.

ii. වෘත්තීය සමිතිවල අසාධාරණ ඉල්ලීම් කාර්මික සාමයට විශාල බලපෑමක් එල්ලකර ඇති බව රජය පවසයි.
අ) වෘත්තීය සමිතියක කාර්යයන් 2 ක් දක්වන්න.
ආ) වෘත්තීය සමිතියක් තම ඉල්ලීම් දිනා ගැනීමට ගනු ලබන කාර්මික ක්‍රියා මාර්ග 4 ක් දක්වන්න.

iii. අ) දත්ත සහ තොරතුරු අතර වෙනස්කම් 3 ක් දක්වන්න.
ආ) දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් මොනවාද?

iv. අ) ඵලදායි තොරතුරු පද්ධතියකින් ව්‍යාපාරයක් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන කාර්යයන් දෙකක් දක්වන්න.
ආ) භාවිතා කරන මට්ටම අනුව විවිධ තොරතුරු පද්ධති පවතී. ඒ අනුව දැනුම් මට්ටමේ තොරතුරු පද්ධතියක් යනු කුමක්ද? එය භාවිතා කරන්නේ කවුරුන්දැයි දක්වන්න.

v. අ) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත විධායක සාරාංශය යනු කුමක්දැයි හඳුන්වන්න.
ආ) ව්‍යාපාර සැලැස්ම වැදගත්වන ආකාර 4 ක් දක්වන්න.

ව්‍යාපාර අධ්‍යයනය
13 ශ්‍රේණිය
තෙවන වාර පරීක්ෂණය - 2024
පිළිතුරු පත්‍රය - I , II පත්‍රය

(1)	3	(9)	3	(17)	5	(25)	2
(2)	4	(10)	1	(18)	5	(26)	1
(3)	2	(11)	3	(19)	4	(27)	4
(4)	5	(12)	5	(20)	1	(28)	2
(5)	2	(13)	3	(21)	5	(29)	5
(6)	4	(14)	4	(22)	1	(30)	1
(7)	1	(15)	4	(23)	3		
(8)	1	(16)	2	(24)	3		

(31) (අ) නිෂ්කර්ශක , නිර්මාණක
(ආ) ව්‍යාපාර , තෘප්තිමත්

(32) (අ) තරගකාරී , සාධාරණ
(ආ) සුබසාධන , රජය

(33) (අ) නියෝජිතයෙකු , ප්‍රධානියෙකු
(ආ) ආයතනික , සමාජීය

(34) (අ) භාරකාර , සමාජික
(ආ) කොටස් , ණයකර

(35) (අ) දේපළ , වන්දියක්
(ආ) උපකරණ , ඉඩකඩ

(36) (අ) මානව , තාක්ෂණික
(ආ) වගකීම හා වගවීම

(37) (අ) තොග පාලනය , ප්‍රශස්ත තොගය
(ආ) තොග ඇණවුම් කිරීමේ , තොග පවත්වා ගෙනයෑමේ

(38) (අ) ප්‍රජා විද්‍යාත්මක , මනෝ විද්‍යාත්මක
(ආ) ක්‍රියාවලිය , භෞතික වටපිටාව

(39) (අ) ස්ථිර , තාවකාලික
(ආ) සෞඛ්‍ය , ආරක්ෂාව

(40) (අ) උපක්‍රමික , දැනුම්
(ආ) ඍජු පිරිවැය , වක්‍ර පිරිවැය

(41) 1 ගෘහ කර්මාන්ත වෙනුවට කම්හල් කර්මාන්ත බිහිවීම
2 අත්යන්ත්‍ර භාවිතය වෙනුවට බලවේග යන්ත්‍ර භාවිතය
3 ස්වයං පරිභෝජනය වෙනුවට වෙළඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම
4 යන්ත්‍රෝපකරණ භාවිතය නිසා මහා පරිමාණ නිෂ්පාදනයට මග පෑදීම
5 ශ්‍රම විභජනය හා විශේෂිකරණය යන ශිල්ප ක්‍රම නිෂ්පාදනයට යොදා ගැනීම

6 ව්‍යාපාරික කෘෂිකර්මාන්තය බිහිවීම

(42) 1 ලියාපදිංචි ගාස්තු ලෙස විදේශ විනිමය රට තුළට ලැබීම

2 විදේශ ප්‍රාග්ධනය රට තුළට ගලාඒම

3 විදේශීය දියුණු තාක්ෂණය මෙරටට ලබාගත හැකිවීම

4 රැකියා අවස්ථා උත්පාදනය

5 සේවා සැපයීමෙන් විදේශ විනිමය උපයා ගැනීමට හැකිවීම

6 රට තුළ නිෂ්පාදනය ඉහළ යාම

(43) 1 ගිණුමේ මුදල් නොමැති වීම

2 අණකරු විසින් බැංකු ගිණුමෙන් ගෙවීම් නවතා ඇතිවිට

3 චෙක්පත නිසියාකාරව ලියා නොමැතිවිට / ලිඛිත වැරදි

4 ගිණුම වසා තිබීම

5 චෙක්පත බොදවී අපහැදිලි වී ඇති විට

6 අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දී තිබීම

7 ගානිෂි නියෝගයක් / උසාවි නියෝගයක් ලැබීම

8 අණකරු බුන්වත්වීම

(44) 1 පණිවිඩය සැකසීම සඳහා වැඩි කාලයක් ගතවීම

2 අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති නම් සන්නිවේදනයට බාධා ඇති වීම

3 තොරතුරු සන්නිවේදනයේදී විකෘතිවීම

4 ප්‍රතිචාර ක්ෂණිකව ලබාගත නොහැකිවීම

5 බහු අර්ථ ගෙන දෙන වචන භාවිතයෙන් සන්නිවේදනයට බාධා ඇතිවීම

(45) 1 විද්‍යුත් වාණිජ්‍යය හරහා විදේශ වෙළඳාම ලොව පුරාම ව්‍යාප්තවීම

2 ආර්ථික වර්ධනය වේගවත් කර ගැනීමටත් ආර්ථික අර්බුදවලට ශක්තිමත්ව මුහුණදීමටත් නව වෙළඳ කලාප හා හවුල් ඇතිවීම

3 සම්ප්‍රදායික අපනයනවලට සීමානොවී ඉහළ තාක්ෂණයෙන් යුතු නිෂ්පාදිත විවිධාංගීකරණය කෙරෙහි යොමුවීම

4 ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදිත දිරිගැන්වීම සඳහා විදේශ වෙළඳ ප්‍රතිපත්තියට යොමු වීම

5 අපනයන භාණ්ඩ පැස පිළිබඳ වර්තමානයේ අවධානය යොමුවෙමින් පැවතීම

(46) 1 තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය

2 ABC විශ්ලේෂණ ක්‍රමය

3 ද්විත්ව භාජන ක්‍රමය

4 JIT ක්‍රමය

5 පරිගණක වැඩ සටහන් ක්‍රමය

6 අඛණ්ඩව තොග වාර්තා කිරීමේ ක්‍රමය

(47) 1 සම්බන්ධතා අලෙවිකරණය

2 සමෝධානිත අලෙවිකරණය

3 අභ්‍යන්තර අලෙවිකරණය

4 කාර්ය සාධන අලෙවිකරණය

(48) 1 අයදුම්පත් ඇගයීම
2 සම්මුඛ පරීක්ෂණ
3 බුද්ධි පරීක්ෂණ
4 පෞරුෂ පරීක්ෂණය
5 ප්‍රායෝගික පරීක්ෂණය
6 වෛද්‍ය පරීක්ෂණය
7 පසුබිම් පරීක්ෂණය

(49) 1 Pass Word
2 Anti Virus
3 Backup
4 Fire Walls
5 පුහුණු කිරීම

(50) 1 ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය
2 ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය
3 ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4 ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
5 ණය ආපසු ගෙවීමේ සටහන (2 x 50 = ලකුණු 100)

පිළිතුරු පත්‍රය - II පත්‍රය

1.

i. (අ) අවශ්‍යතාවය - සෞඛ්‍යය (ලකුණු 01)
වුවමනාව - දියවැඩියාව සඳහා ඖෂධ (ලකුණු 01)

(ආ) 1 රැකියා උත්පාදනය
2 ආර්ථික සංවර්ධනයට දායක වීම
3 විදේශ විනිමය ඉපයීම
4 සමාජ වගකීම් ඉටුකරමින් සමාජ සංවර්ධනයට දායකවීම
5 ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන පාර්ශවයන්ට විවිධ ප්‍රතිලාභ ලබාදීම
6 මිනිස් වුවමනා සපුරාලීමට අවශ්‍ය නිෂ්පාදිත (ඖෂධ) සැපයීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

ii. (අ) අයිතිකරු (සනත්) ගනුදෙනුකරුන්
සේවකයන් තරගකරුවන්
රජය සැපයුම්කරුවන්
ප්‍රජාව ස්වභාවික පරිසරය ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) ඖෂධ විදේශයන්ගෙන් ආනයනය
ඖෂධ වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම (1 x 2 = ලකුණු 02)

iii. (අ) 1 විදේශ විනිමය නීති රීති හා විදේශ විනිමය හිඟය

2 ආනයන බදු වියදම ඉහළ යාම

3 පරිසර නීති රීතිවල බලපෑම්

4 ආනයන තහනම් කිරීම් හෝ සීමා කිරීම් ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 ඉහළ සේවකයන් ලබාදීම

2 විදේශීය රෝගීන් සඳහා නේවාසික පහසුකම් ඉහළ නැංවීම

3 සුවපත් වූ විදේශීය රෝගීන් හරහා විදේශිකයන් දැනුවත් කිරීම

4 අන්තර්ජාලය හරහා විදේශිකයන් දැනුවත් කිරීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iv. අයිතිකරු - ප්‍රමාණවත් ලාභයක්

සේවකයන් - සාධාරණ වැටුප්

ගනුදෙනුකරුවන් - ගුණාත්මක සේවාව

රජය - නිසි පරිදි බදු ගෙවීම

ප්‍රජාව - රැකියා අවස්ථා සැපයීම

ස්වභාවික පරිසරය - පරිසරය සුරක්ෂිත කිරීම

(පාර්ශව 4 x $\frac{1}{2}$ = ලකුණු 02)

(උදාහරණ 4 x $\frac{1}{2}$ = ලකුණු 02)

v. (අ) 1 ව්‍යාපාරයේ පැවැත්ම තහවුරුවීම

2 ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම

3 ගනුදෙනුකරුවන් තුළ ව්‍යාපාරය පිළිබඳ විශ්වාසනීයත්වය තහවුරුවීම

4 ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකිවීම

5 ව්‍යාපාරයේ පරමාර්ථ හා අරමුණු කරා ළඟාවීමට පහසුවීම

6 රාජ්‍ය අනුග්‍රහය ලැබීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 ආර්ථික වර්ධනය හා ස්ථායිතාව ඇතිකිරීම

2 සම්පත් කාර්යක්ෂමව භාවිතය

3 තරගකාරීත්වය වර්ධනය

4 නිෂ්පාදනය හා පාරිභෝජනය

5 සේවා නියුක්තිය ඉහළ නැංවීම

6 අන්තර්ජාතික වෙළඳාමේ යෙදීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

2.

i. (අ) 1 මධ්‍යම රජය

2 පළාත් සභා

3 පළාත් පාලන ආයතනය (1 x 2 = ලකුණු 02)

(ආ) 1 බදු ගෙවීම

2 දේශීය සම්පත් භාවිතා කිරීම

3 රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම

4 නීතිරීති පිළිපැදීම

5 සේවා නියුත්කියට දායකවීම

6 පරිසරයට වන හානිය අවම කිරීම

7 විදේශ විනිමය ඉපැයීම

8 නවෝත්පාදන බිහිකිරීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

ii. (අ) 1 ජයසිර ගුණත්වයෙන් උසස් භාණ්ඩ සාධාරණ මිලට සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය තහවුරු වීම

2 පිරිවැටුම ඉහළ ගොස් ජයසිරිගේ ලාභය ඉහළ යෑම

3 ප්‍රමිතියට අනුව නිෂ්පාදනය නිසා අපතය අවම වීම

4 අයහපත් තරග විරෝධී ක්‍රියා නොමැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇතිවීම

5 පාරිභෝගික පැමිණිලි අවම වීම හා නීතිමය ක්‍රියාමාර්ග අවම වීම

6 පාරිභෝගික සබඳතා තරවීම මගින් ලබන වාසි ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 පාරිබෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2 ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

3 මිණුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව

4 මධ්‍යම පරිසර අධිකාරිය

5 ප්‍රාදේශීය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය

6 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iii. (අ) ඔව්

අයිතිකරුගේ සම්පූර්ණ නමින් ව්‍යාපාරය පවත්වාගෙන නොයන නිසා (ලකුණු 01)

(ආ) 1 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත්)

2 අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වාර්තාව (ලකුණු 01)

iv. (අ) 1 අයිතිකරුගේ අසීමිත වගකීම

2 ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා

3 තනි තීරණ අසාර්ථක විය හැකි වීම

4 නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම

5 අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම

6 අලාභ තනිව භුක්ති විඳීමට සිදුවීම

7 ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගැනීමට හැකිවීම

2 නෛතික පුද්ගලභාවය හිමිවීම

3 වගකීම සීමිත වීම

4 අඛණ්ඩ පැවැත්මක් හිමිවීම

5 අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය සිදුවීම

6 දක්ෂ කළමනාකරුවන් බඳවා ගැනීමට හැකිවීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

v. (අ) 1 දැඩි තරගකාරීත්වයකට මුහුණදීමට සිදුවීම

2 ආහාරවල ගුණාත්මකභාවය

3 ප්‍රාග්ධනය සීමිත වීම

4 දේශීය හා විදේශීය සංචාරකයන් සංඛ්‍යාව අවම වීම (1 x 2 = ලකුණු 02)

(ආ) 1 නායකත්ව කුසලතා

2 අන්තර් පුද්ගල කුසලතා

3 සන්නිවේදන කුසලතා

4 මූලික කළමනාකරණ කුසලතා ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

3.

i. (අ) ව්‍යවසායිකාවකි (ලකුණු 02)

(ආ) 1 ව්‍යාපාර කටයුතු පුළුල් කරගැනීමට අවකාශ හිමිවීම

2 තරගකාරීත්වයට මුහුණදීමට පහසුවීම

3 ව්‍යාපාරය අඛණ්ඩව පුළුල් කරගත හැකිවීම

4 වෙළඳපොළ කොටස පුළුල් වීම

5 ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම

6 කර්මාන්තය තුළ විශිෂ්ඨයින් බවට පත්වීම

7 ලාභදායිත්වය වැඩිකර ගැනීමට හැකිවීම

8 රජයේ ඇගයීමට ලක්වීමට හැකිවීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

ii. (අ) පාරිසරික ගැටලු හෝ සමාජීය ගැටලු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවදානයක් යොමු කරමින් ස්වභාවික පරිසරයට ධානාත්මක බලපෑම් ඇති කිරීමයි. (ලකුණු 02)

(ආ) ස්වාධීන අයිතිය හා ස්වාධීනව ක්‍රියාත්මක වන එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාරයි. (සුදුසු නිර්වචනයකට ලකුණු දෙන්න) (ලකුණු 02)

iii. (අ) 1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ඇරඹීම අවදානම් සහගතය. එහෙත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව තුළින් එම අවදානම අවම කරගත හැක.

2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක වීමට නම් කැපවීම හා උනන්දුව තිබිය යුතුය. ව්‍යවසායකයා තම කැපවීම හා උනන්දුව මගින් ව්‍යාපාරය සාර්ථක කරගත හැක.

3 ව්‍යවසායකයා තුළ පවතින ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය කෙරෙහි බලපායි.

4 ව්‍යාපාරය සාර්ථක කරගැනීම සඳහා ව්‍යවසායකත්ව නිපුණතා අවශ්‍යවන අතර ඒවා සංවර්ධනය කරගැනීමට හැකිවීම නිසා වයාපාරය සාර්තක කරගත හැකිවේ. (1 x 2 = ලකුණු 02)

(ආ) 1 උපදේශන සේවා

2 ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්

3 යටිතල පහසුකම් සැපයීම

4 පර්යේෂණ හා තාක්ෂණික සේවා

5 වෙළඳපොළ /අලෙවි පහසුකම්

6 විශිෂ්ඨතා සම්මාන ලබාදීම

7 තොරතුරු සේවා ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iv. (අ) පහසුවෙන් හා මූල්‍ය අලාභයකින් තොරව මුදල් බවට පත් කිරීමේ හැකියාව (ලකුණු 01)

(ආ) ආසන්න මුදල්වලට වඩා බැංකු මුදල් ද්‍රවශීලතාවයෙන් ඉහළ වේ. (ලකුණු 01)

(ඉ) 1 කුලී පිට ගැණුම් පහසුකම් සැපයීම

2 කොටසක් ආරක්ෂණය

3 කල්බදු මූල්‍යකරණය

4 කෙටිකාලීන ණය සැපයීම

5 රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

6 කාලීන තැන්පත් භාරගැනීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

v. (අ) 1 ශ්‍රී ලංකා මහ බැංකුව

2 බලපත්‍රලාභී වාණිජ බැංකු

3 රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්

4 සේවක අර්ථසාධක අරමුදල ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ)

ස්ථාවර බැංකු අයිරා	තාවකාලික බැංකු අයිරා
1 පියවීම සඳහා වර්ෂයක් වැනි කාලයක් ලැබේ	1 දින 30 සිට 90 දක්වා කාලයකින් පියවිය යුතුයි
2 සාපේක්ෂව පොළිය අඩුය	2 සාපේක්ෂ පොළිය
3 ඇප සුරකුම් අවශ්‍ය වේ	3 ඇප සුරකුම් අවශ්‍ය නොවේ
4 ගිණුම් හිමියාගේ ලිඛිත ඉල්ලීමක් මත ලබාදේ	4 කෙටි දැනුම්දීමක් මත ලබාදේ

(1 x 2 = ලකුණු 02)

4.

i. (අ) 1 පළමු පක්ෂය - රක්ෂිතයා

දෙවන පක්ෂය - රක්ෂකයා

තෙවන පක්ෂය - රක්ෂණ ගිවිසුමේ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ බාහිර සියලු පුද්ගලයන් හා දේපළ (ලකුණු 02)

(ආ) 1 මෝටර් රථයේ වටිනාකම

2 රක්ෂණය සඳහා ඇතුළත් කරන ආවරණ

3 මෝටර් රථය නිෂ්පාදනය කරන ලද වර්ෂය හා මෝටර් රථ වර්ගය

4 මෝටර් රථය යොදාගනු ලබන වර්ෂය ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

ii. (අ) 1 ජංගම දුරකතනය

2 විද්‍යුත් තැපෑල

3 අන්තර්ජාලය

4 Fax

5 Whatsapp ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 නව සන්නිවේදන උපකරණ හඳුන්වාදීම

2 සන්නිවේදනය පිළිබඳ විවිධ නීතිරීති පැනවීම

3 පෞද්ගලික අංශය හා එක්ව සන්නිවේදන කුළුන පිහිටුවීම

4 ඩිජිටල් තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම

5 සන්නිවේදන ක්‍රම අවභාවිතය පිළිබඳ නව රීති සම්පාදනය ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iii. (අ) කිරි - ශීතාගාර සහිත බවුසර

මුහුදු මාළු - ශීතාගාර සහිත ලොරි රථ

ස්වාභාවික මල් - වායුසමීකරණය කරන ලද වෑන් රථ

පළතුරු - ප්ලාස්ටික් කූඩ සහිත කුඩා ලොරි රථ / වෑන් රථ ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 සේවා නියුක්තිය වර්ධනය වීම

2 ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම

3 විදේශ වෙළදාම වර්ධනය වීම

4 ජාතික නිෂ්පාදිතය වර්ධනය වීම

5 ආර්ථික වර්ධනයට සහාය වීම

6 ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iv. (අ) 1 තම ආයතනයේ වාහන ධාවනයේදී දැනට තිබෙන ස්ථානය පිළිබඳව දැනගත හැකිවීම

2 අදාළ ස්ථානයන්හි පිහිටීම පිළිබඳ අවබෝධයක් ලැබීම

3 පිරිවැය තීරණය කළ හැකිවීම

4 අදාළ දුර ප්‍රමාණය / කාලය දැනගත හැකිවීම

5 ළඟාවිය හැකි කෙටිම මාර්ගය හඳුනාගත හැකිවීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 අන්තර්ජාලය

2 වාණිජ මණ්ඩලය

3 විදේශ තානාපති කාර්යාලය

4 විදේශ වෙළඳ නාමාවලිය

5 ලෝක වෙළඳ මධ්‍යස්ථාන තොරතුරු

6 අන්තර්ජාතික වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන

7 විදේශීය වාණිජ සඟරා

8 වෙළඳ දූතයන් යැවීම

9 පෞද්ගලික සම්බන්ධකම් ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

v. (අ) A - වෙදිකා කුවිතාන්සිය - නිකුත් කිරීම - රේගුව ලබන පාර්ශවය - අපනයනකරු

B - හානි රක්‍ෂණ ලිපිය - නිකුත් කිරීම - අපනයනකරු - ලබන පාර්ශවය - නැව්කපිතාන්

($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) 1 කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය

2 විදුලි සංදේශ , විද්‍යාව , තාක්‍ෂණය හා දේශගුණික විද්‍යාව

3 සෞඛ්‍යය හා ජනගහන කටයුතු

4 ප්‍රවාහනය

5 මානව සම්පත් ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

5.

i. (අ) ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ හා අරමුණු සඵලදායිව ඉටු කරගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්යක්‍ෂමතාවෙන් සැලසුම්කරණය , සංවිධානකරණය , මෙහෙයවීම හා පාලනය ඇතුළත් ඵලදායි ක්‍රියාවලියකි. (ලකුණු 02)

(ආ) අන් අය සමඟ සහ අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාව (ලකුණු 02)

ii. (අ) අන් අය අවබෝධ කර ගැනීමට , ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීමට , ඔවුන් ලවා වැඩ කරවා ගැනීමට හා මානුෂිකව සැලකීමට (ලකුණු 02)

(ආ)



(ලකුණු 02)

iii. (අ) 1 අනාගත අවිනිශ්චිතතාවලට හා ගතික පරිසරයට සාර්ථකව මුහුණ දීමට

2 සම්පත් උපරිම කාර්යක්‍ෂමතාවෙන් යොදවා ගැනීමට

3 පාලනයට පහසුකම් සැලසීමට

4 කළමනාකරුවන්ට අනාගතය ගැන සිතීමට අවස්ථා සැලසීමට

5 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම හා වර්ධනය තහවුරු කිරීමට

6 වර්තමාන හා අනාගත තරගකාරීත්වය ඇගයීමට

7 වෙනස් පාර්ශව දිරි ගැන්වීමට හා ඒත්තු ගැන්වීමට (1 x 2 = ලකුණු 02)

(ආ) සඵලදායකත්වය යනු ආයතනයක් විසින් කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු නිවැරදිව ළඟා කර ගනු ලබන්නේද යන්න (නිවැරදි දෙය කිරීම) (ලකුණු 01)

කාර්යක්ෂමතාව යනු අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේදී අවම සම්පත් ප්‍රමාණයක් භාවිත කර උපරිම නිමැවුමක් ළඟා කර ගැනීම (කළ යුතු කාර්ය නිවැරදිව කිරීම) (ලකුණු 01)

iv. (අ) 1 විවිධ කළමනාකරණ මට්ටම් ඇති බව

2 අධිකාරිය ධුරාවලියක් ලෙස පවතින බව

3 විවිධ මට්ටම්වල කළමනාකරුවන්ට විවිධ කුසලතා අවශ්‍ය වන බව

4 සංවිධානයේ ඉහළ මට්ටමේ කළමනාකරුවන් ප්‍රමාණයට වඩා පහළ මට්ටමේ කළමනාකරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින බව (1 x 2 = ලකුණු 02)

(ආ) <u>මූල්‍යමය</u>

1 වැටුප්

2 කොටස් හිමිකාරිත්ව ලබාදීම

3 ප්‍රසාද දීමනා ලබාදීම

4 ණය පහසුකම් ලබාදීම

5 නිෂ්පාදන දිරිදීමනා

6 ආයතනයේ නිෂ්පාදිත සහන මිලට ලබාදීම ($\frac{1}{2}$ x 2 = ලකුණු 01)

<u>මූල්‍යමය නොවන</u>

1 සේවකයින් පුහුණු කිරීම

2 උසස් වීම් ලබාදීම

3 රැකියා සුරක්ෂිත බව ඇති කිරීම

4 සේවකයින් ඇගයීම

5 වෙනත් ------ ($\frac{1}{2}$ x 2 = ලකුණු 01)

v. එක් වරකට එක සමාන භාණ්ඩ සමූහයක් නිෂ්පාදනය කිරීම. (ලකුණු 02)

<u>හිතකර ලක්ෂණ</u>

1 කාණ්ඩයෙන් කාණ්ඩයට නිෂ්පාදිතයේ නිමාව වෙනස් කළ හැකිවීම

2 ඇණවුම් නිෂ්පාදනයට සාපේක්ෂව ඒකක පිරිවැය අඩු වීම

3 සාපේක්ෂව විශාල තොග වශයෙන් නිෂ්පාදනය කළ හැකිවීම නිසා පිරිවැටුම ඉහළ යාම

<u>අහිතකර ලක්ෂණ</u>

1 ප්‍රවාහන නිෂ්පාදනයට සාපේක්ෂව ඒකක පිරිවැය වැඩිවීම

2 ප්‍රවාහ නිෂ්පාදනයට සාපේක්ෂව මහා පරිමාණ පිරිමැසුම් අඩුවීම

3 කාණ්ඩයෙන් කාණ්ඩයට යන්ත්‍ර හා උපකරණ නැවත සැකසීමට සිදුවීම නිසා පිරිවැය වැඩිවීම (1 x 2 = ලකුණු 02)

6.

i. (අ) 1 නිෂ්පාදිතයේ ස්වභාවය

2 දැරිය යුතු පිරිවැය

3 වෙළෙඳ පොළ ප්‍රමාණය

4 මිලදී ගැනීමේ රටාව

5 සම්පත් ලබාගැනීමේ පහසුව

6 යොදා ගන්නා තාක්ෂණය හා අවශ්‍ය උපකරණය ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

(ආ) කාණ්ඩ නිෂ්පාදනය

එක් වරකට එක සමාන භාණ්ඩ සමූහයක් (බේකරි නිෂ්පාදන) නිෂ්පාදනය කිරීමට හැකිවීම උදා:- පාන් , බනිස් ආදිය (ලකුණු 02)

ii. (අ) කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීම සඳහා යොදාගනු ලබන සම්පත්වල මූල්‍ය වටිනාකම (ලකුණු 02)

(ආ) 1 නිෂ්පාදිත පිරිවිතර

2 ද්‍රව්‍යවල ගුණත්වය

3 මිල

4 සැපයීමේ වේගවත්බව හා අඛණ්ඩව ලබාගත හැකි බව

5 සැපයුම්කරුගේ විශ්වාසවන්ත බව

6 පොරොත්තු කාලය

7 ගෙවීම් කොන්දේසි ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iii. (අ) 1 නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීමට නොහැකිවීම

2 අපතේ යාම් ඉහළ යාම

3 නිමැවුම්වල ගුණත්වය පහළ යාම

4 යන්ත්‍ර උපකරණවල හානි සිදු විය හැකිවීම (1 x 2 = ලකුණු 02)

(ආ) 1 නිෂ්පාදනය හා අලෙවි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට

2 ඌන හෝ අතිරික්ත හෝ තොග පවත්වා ගැනීමෙන් සිදුවන වියදම අවම කර ගැනීමට

3 යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රමය ආදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට

4 අනපේක්ෂිත ඉල්ලුම් තත්ත්වයන්ට සාර්ථකව මුහුණදීමට (ලකුණු 02)

iv. (අ) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට භාණ්ඩයකට හෝ සේවාවකට ඇති හැකියාවයි. (ලකුණු 02)

(ආ) 1 මනා ක්‍රියාකාරිත්වය

2 කල් පැවැත්ම

3 විශ්වාසවන්ත භාවය

4 ප්‍රමිතියට අනුකූල වීම

5 උචිත බව

6 ආරක්ෂිත බව ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

v. අලෙවිකරණය විකිණීම සම්බන්ධ කාර්යයක් පමණක් නොවන අතර විකිණීම අලෙවිකරණයේ එක් කොටසක් පමණි. තවත් කාර්යයන් රාශියක් දැකිය හැක. (ලකුණු 04)

උදා :- වෙළෙඳපොල පරීක්ෂණ , ප්‍රමිතිකරණය , ගබඩා කිරීම හා බෙදාහැරීම , ඇසුරුම්කරණය , ප්‍රචාරණය ආදී ඇතුළත් වන පරිදි මෙවැනි අදහස් පැහැදිලි කිරීමට

7.

i. (අ) 1 ගෙවන ලද මාධ්‍ය :-

ආයතනයක් විසින් තම නිෂ්පාදිත පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවා ප්‍රචාරණ මාධ්‍යයක් භාවිත කරනු ලැබීම

2 අයිති කර ගන්නා ලද මාධ්‍ය :-

ආයතන විසින් තම නිෂ්පාදන පිළිබඳ පාරිභෝගිකයාට දැන්වීම් පිණිස තමා විසින් ම නිර්මාණය කරගත් තමාට අයිති මාධ්‍යයක් යොදා ගනු ලැබීම

3 උපයන ලද මාධ්‍ය :-

තමන් විසින් කිසිදු මුදලක් නොදරා තම නිෂ්පාදිත පිළිබඳ සුබ පණිවුඩයක් තම පාරිභෝගික ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය වීම (1 x 2 = ලකුණු 02)

(ආ) වටිනාකම :- පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව පිළිබඳව පාරිභෝගිකයා විසින් කරනු ලබන සමස්ත ඇගයීමයි.

තෘප්තිය :- පාරිභෝගිකයා අපේක්ෂා කරන ආකාරයට නිෂ්පාදිතයක් බිහි කිරීම මගින් පාරිභෝගිකයා අත්පත් කර ගනු ලබන සතුට (1 x 2 = ලකුණු 02)

ii. (අ) 1 තමා වියදම් කරන මුදලට උපරිම තෘප්තියක් ලැබීම

2 වෙළඳපොළ පිළිබඳ තොරතුරු ලැබීමෙන් තමා දැනුවත් වීම

3 වෙළෙඳපොළ භාණ්ඩ හා සේවා සුලභවීම

4 ඉතා පහසුවෙන් නිෂ්පාදිත ලබාගත හැකිවීම

5 විවධ භාණ්ඩ පරිභෝජනයෙන් ජීවන තත්ත්වය ඉහළ නංවා ගත හැකිවීම

(1 x 2 = ලකුණු 02)

(ආ) භාණ්ඩයක් හෝ සේවාවක් හෝ පිළිබඳව පාරිභෝගිකයන්ගේ මනසෙහි ඉඩක් ඇති කරලීමයි. (ලකුණු 01)

ආකාර :-

1 භාණ්ඩය තුළ විවිධ ගුණාංග හා ප්‍රයෝජන ඇතුළත් කිරීම

2 තරගකරුවන්ට සාපේක්ෂව වඩා ඉහළ සේවාවක් ලබාදීම

3 විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කරමින් ගනුදෙනුකරුවන්ගේ මනස තුළ භාණ්ඩය හෝ සේවාව ගැඹුරින් තැන්පත් කිරීම ($\frac{1}{2}$ x 2 = ලකුණු 01)

iii. (අ) 1 පිරිවැටුම වැඩිකරගැනීම මගින් ලාභය වැඩි කරගැනීමට

2 කීර්තිනාමය වැඩි කර ගැනීමට

3 එක් නිෂ්පාදිතයකින් සිදුවන අලාභ අනෙක් නිෂ්පාදිතවල ලාභයෙන් ආවරණය කර ගැනීමට

4 වෙළඳපොළ විවිධාංගීකරණයට

5 ප්‍රවර්ධන හා බෙදාහැරීමේ පිරිවැය අඩු කර ගැනීමට (1 x 2 = ලකුණු 02)

(ආ) පළල - ආයතන සතු නිෂ්පාදිත පෙළවල් ගණන උදාහරණ සුදුසු නිදසුනක්

දිග - සියලුම භාණ්ඩ පෙළවල අන්තර්ගත නිෂ්පාදිත ගණන උදා: සුදුසු නිදසුනක්

(1 x 2 = ලකුණු 02)

iv. (අ) භාණ්ඩයක හඳුන්වාදෙන අවස්ථාවේ සිට විකුණුම් පිරිහීමේ අදියර දක්වා පවතින අදියරයන් (ලකුණු 02)

(ආ) 1 භාණ්ඩයේ ස්වභාවය

2 වෙළෙඳපොළේ ස්වභාවය

3 ඉල්ලුමේ ස්වභාවය

4 නිෂ්පාදකයාගේ ශක්තිය

5 තරගකරුවන්ගේ බෙදාහැරීමේ මාර්ග ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

v. මූල්‍යන තීරණ :-

ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණයි. එනම් අවශ්‍ය මූල්‍ය සම්පාදනය කරගන්නේ කෙසේද යන්නයි

ආයෝජන තීරණ :-

අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල යෙදවීම පිළිබඳව ගනු ලබන තීරණයි. සම්පාදනය කරගත් අරමුදල් ව්‍යාපාරයේ විවිධ අවශ්‍යතා අතර යොදවන්නේ කෙසේද යන්නයි.

(2 x 2 = ලකුණු 04)

8.

i. (අ) 1 කෙටිකාලීන වගකීම්වලට මුහුණදීමට ඇති හැකියාව දැනගත හැකිවීම

2 ජංගම වගකීම් ක්ෂණිකව පියවීමේ හැකියාව දැනගත හැකිවීම

3 කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හඳුනාගැනීමට ආදි කරුණු ඇතුළත්ව පැහැදිලි කිරීමට

(ලකුණු 02)

(ආ) 1 අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ

2 දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ

3 රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ

4 සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළ ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

ii. (අ) 1 ඉහළ හා ස්ථාවර පොළියක් හිමි වීම

2 රජයේ ආරක්ෂාව ලැබීම

3 ආයෝජන අවස්ථාවේදීම ප්‍රතිලාභ හිමි වීම

4 ආයෝජන අවධානම ඉතා අඩු මට්ටමක පැවතීම

5 ඉහළ ද්‍රවශීලිතාවයක් පැවතීම

6 කල්පිරීමට පෙර වට්ටම් කරගත හැකිවීම

7 බදු සහන හිමිවීම

8 සුරැකුම්පත් , ඇප සුරැකුම් ලෙස භාවිත කළ හැකිවීම (1 x 2 = ලකුණු 02)

(ආ) 1 සමාගම ලබන ලාභය

2 තරගකාරී සමාගම් ගෙවන ලාභාංශ

3 පෙර වර්ෂයේ ගෙවා ඇති ලාභාංශ

4 යෝජිත ලාභාංශ ඉදිරි වර්ෂවලත් ගෙවිය හැකිද යන්න

5 තැන්පතු සඳහා බැංකු ගෙවන පොළී අනුපාත

6 කොටස් හිමියන්ගේ කැමැත්ත ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iii. (අ) කිසියම් රැකියාවකට අයත් කටයුතු, රාජකාරී, වගකීම් , සේවා කොන්දේසි, වැඩ කළ යුතු පැය ගණන , රැකියාවේ ස්වභාවය , වගකිව යුත්තේ කාහට ද ආදි විස්තර කෙරෙන ප්‍රකාශය

(ලකුණු 02)

(ආ) 1 භාණ්ඩය හෝ සේවාව සඳහා වූ ඉල්ලුම

2 ආයතනයේ පරමාර්ථ

3 ආයතනය භාවිත කරනු ලබන නිෂ්පාදන ක්‍රමය

4 ආයතනයේ වර්තමාන හා අනාගත මූල්‍ය තත්ත්වය

5 ආර්ථික , සමාජීය , දේශපාලන හා නෛතික පරිසරය

6 අනාගත සේවක විශ්‍රාම යාම්, ඉල්ලා අස්වීම්, උසස් වීම්, ඉවත් කිරීම්, සේවා නියුක්තිය අවසන් කිරීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02)

iv. (අ) 1 සේවක දැනුම, කුසලතා හා ආකල්ප යාවත්කාලීන වීම

2 සේවක කාර්ය සාධනය වර්ධනය වීම

3 නිමැවුමේ ගුණාත්මකභාවය ඉහළ යාම

4 සේවක ප්‍රවාසිකව අඩුවීම

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

5 සේවක අභිප්‍රේරණ ඇතිවීම

6 සේවක පිරිවැටුම අඩුවීම

7 සේවක පක්ෂපාතීත්වය ඉහළ යාම

8 සේවකයන් අතින් ඇතිවන වැරදි හා නාස්තිය අඩුවීම (1 x 2 = ලකුණු 02)

(ආ) දත්ත තොරතුරු

දත්ත	තොරතුරු
1. දත්ත යෙදවුමකි / අමුද්‍රව්‍යයකි	1. තොරතුරු නිමැවුමකි / නිමි ද්‍රව්‍යකි
2. දත්ත තීරණ ගැනීම සෘජුවම භාවිත කළ නොහැකිය	2. තොරතුරු තීරණ ගැනීමට සෘජුවම භාවිත කළ හැකිය
3. දත්ත දත්ත වශයෙන් පවතින තෙක් වටිනාකමක් ගෙන නොදේ	3. තොරතුරුවලින් වටිනාකමක් ගෙන දේ
4. දත්ත සැකසුම් ක්‍රියාවලියට අදානය කරන මූලික දේ දත්ත වේ	4. දත්ත සැකසීමේ ක්‍රියාවලියෙන් බිහිවන ප්‍රතිදානය තොරතුරු වේ.

(1 x 2 = ලකුණු 02)

v. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස විධායක සාරාංශය වේ. ව්‍යාපාර සැලසුමක් පරිශීලනය කරන පුද්ගලයෙකුට ව්‍යාපාරයේ වැදගත්ම කරුණු සාරාශගත ඉදිරිපත් කිරීම මෙහිදි සිදුවේ. (ලකුණු 02)

වැදගත්කම :-

1 විධායක සාරාංශය සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳව පෙර දැක්මක් ඇති කිරීම

2 ව්‍යාපාර සැලැස්ම පිළිබඳව මග පෙන්වීමක් ලබාදීම

3 ව්‍යාපාර සැලැස්ම පිළිබඳව විශ්වාසයක් ඇති වීම

4 ව්‍යාපාරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට ඇති හැකියාව

ආදි කරුණු ඇතුළත් පරිදි විස්තර කිරීමට සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ලකුණු 02)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න